වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை 2021
Annual Report

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව
அரசகரும மொழிகள் ஆணைக்குழு
Official Languages Commission

"ජනජයසිටි"ගොඩනැගිල්ල, 09 වනමහල, නාවලපාර, රාජගිරිය.
"ஜனஜயசிட்டி" கட்டடத்தொகுதி, 09 ஆம் மாடி, நாவல வீதி, இராஜகிரிய.
"Janajayacity" Building, 09th floor,Nawala Road, Rajagiriya.
http://olc.gov.lk/

විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / **E-Mail**
olcommission@gmail.com
olc@sltnet.lk

කාර්යාලය / அலுவலகம் / **Office**
2889482

පටුන

හැඳින්වීම 3

I කොටස 4 - 10

1. දැක්ම
2. මෙහෙවර
3. අරමුණු
4. ප්‍රධාන කාර්යයන්
5. සංවිධාන ව්‍යුහය - **2021/12/31** දිනට රාජ්‍ය භාෂා කොමිෂන් සභාවෙහි සංවිධාන ව්‍යුහය
6. කොමිෂන් සභා රැස්වීම්
7. වෙබ් අඩවිය ප්‍රතිනිර්මාණය කිරීම.
8. කොමිෂන් සභාව නව කාර්යාල පරිශ්‍රයකට ගෙන ඒම.

II කොටස 11 - 20

1. අධීක්ෂණය - භාෂා විගණන පැවැත්වීම.
2. විමර්ශනය - පැමිණිලි විමර්ශනය
3. අධ්‍යාපනය - දැනුවත් කිරීමේ වැඩසටහන්
4. ජාතික භාෂා සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතිය (NLEAP) සමඟ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

III කොටස - මූල්‍ය ප්‍රකාශන 21 - 40

IVකොටස - විගණකාධිපති වාර්තාව 41 - 48

හැඳින්වීම

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2021 වාර්ෂික වාර්තාවෙහි පළමුවන කොටසෙහි කොමිෂන් සභාවෙහි දැක්ම, මෙහෙවර, අරමුණු සහ සාමාජිකයන් පිළිබඳ තොරතුරු, කාර්යමණ්ඩල තොරතුරු සමඟ පරිපාලනයට අදාළ කරුණු ඇතුළත්ය.

1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතෙහි අරමුණු 4ක් ඇත. මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා අධීක්ෂණය, විමර්ශනය, අධ්‍යාපනය සහ උපදේශනය යන ප්‍රධාන කාර්යයන්ට අදාළව භාෂා විගණන පැවැත්වීම, මහජන පැමිණිලි විමර්ශනය, දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ රජය වෙත නිර්දේශ ලබාදීම ආදී ක්‍රියාකාරකම් සිදුකරයි. එම ක්‍රියාකාරකම්වලට අදාළ තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ දෙවන කොටසෙහි ඇතුළත්වේ.

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනය සහ එම කාලයට අදාළවන විගණකාධිපතිගේ නිරීක්ෂණ ඇතුළත් අවසන් විගණන වාර්තාව මෙම වාර්තාවෙහි පිළිවෙලින් තුන්වන සහ හතරවන කොටස්වල ඇතුලත්වේ.

I කොටස

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව 1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතෙහි විධිවිධානවලට අනුකූලව ස්ථාපනය කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි.

01. දැක්ම

මහජනයා වෙත සේවය සපයනු ලබන සියලු ආයතනවල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට බලගැන්වූ ආයතනය බවට පත්වීම.

02. මෙහෙවර

රාජ්‍යභාෂාප්‍රතිපත්තියක්‍රියාත්මකකිරීමසම්බන්ධයෙන් විමර්ශනය, අධීක්ෂණය, අධ්‍යාපනය සහ උපදේශනය මගින් මහජනතාවගේ ද්වීභාෂාමය අවශ්‍යතා සැපයීම.

03. අරමුණු

කොමිෂන්සභාවේපොදුඅරමුණුපහතසඳහන්පරිදි වේ.

(අ) රාජ්‍ය භාෂා භාවිතය පිළිබඳ ප්‍රතිපත්තිමය මූලධර්ම නිර්දේශ කිරීම සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ අන්තර්ගත විධිවිධාන අනුව ක්‍රියාකිරීම පිළිබඳව විමසිලිමත් වීම හා අධීක්ෂණය කිරීම.

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වන ව්‍යවස්ථාවෙහි සඳහන් භාෂා භාවිතය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ භාවාර්ථයට හා චේතනාවට අනුකූලව සිදුවන බවට වග බලා ගැනීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ක්‍රියාවන් කිරීම සහ පියවර ගැනීම.

(ඇ) රාජ්‍ය භාෂා ඇගයීම, දිරිගැන්වීම සහ ඒවායේ තරාතිරම, සමානත්වය සහ භාවිත කිරීමේ අයිතිවාසිකම පිළිගැනීම, පවත්වාගෙන යාම සහ ඉදිරියට ගෙන යාම.

(ඈ) සිය මෙහෙයවීමෙන් සහ ලැබෙන යම් පැමිණිලිවලට ප්‍රතිචාර වශයෙන් යන දෙයාකාරයෙන්ම විමර්ශන පැවැත්වීම හා මේ පනතේ විධිවිධාන වලින් සලසා ඇති පරිදි ප්‍රතිකර්ම යෙදීම.

04. ප්‍රධාන කාර්යයන්

උක්ත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කොමිෂන් සභාව මගින් ප්‍රධාන කාර්යයන් හතරක් ඉටුකරනු ලැබේ.

1. ප්‍රතිපත්තිමය මූලධර්ම සම්පාදනය - උපදේශනය

2. රාජ්‍ය භාෂා භාවිතය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන රාජ්‍ය යාන්ත්‍රණය විසින් නිසි පරිදි අනුගමනය කරන්නේද යන්න ගැන - අධීක්ෂණය

3. අදාළ භාෂාවල තරාතිරම හෝ භාවිතය පිළිබඳව දැනුවත් කිරීම - අධ්‍යාපනය

4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත භාෂා අයිතීන් උල්ලංඝනය කිරීම පිළිබඳ පැමිණිලි - විමර්ශනය

05. සංවිධාන ව්‍යූහය


රාජ්‍ය භාෂා කොමිෂන් සභාව පත්කරනු ලබන්නේ ජනපතිවරයා විසිනි. කොමිෂන් සභාව සාමාජිකයන් හයදෙනෙකුගෙන් සමන්විත වේ. එක් සාමාජිකයෙකු කොමිෂන් සභාවේ සභාපති වශයෙන් නම් කරනු ලබයි. සභාපතිවරයා කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියාද වේ.

2020/01/22 දින පත් කරන ලද කොමිෂන් සභාව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය.

1. **නීතිඥ ඩී. කලංසූරිය (සභාපති)**
2. **මහාචාර්ය සඳගෝමී කෝපරහේවා (කොළඹ විශ්ව විද්‍යාලය)**
3. **මහාචාර්ය රදිරාණි යෝගේන්ද්‍රරාජා (යාපනය විශ්ව විද්‍යාලය)**
4. **මහාචාර්ය දුෂ්‍යන්ති මෙන්ඩිස් (කොළඹ විශ්ව විද්‍යාලය)**
5. **ආචාර්ය කවිතා රාජරත්නම් (කැළණිය විශ්ව විද්‍යාලය)**
6. **වසන්ත ඒකනායක (හිටපු ලේකම් - සංස්කෘතික, කලා සහ බුද්ධශාසන අමාත්‍යාංශය)**

මෙම කාල සීමාව සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (1) වන පන්තියේ නිලධාරිනියක වන රාජ්‍ය භාෂා කොමසාරිස් සැනෝජී රුවිනිකා පෙරේරා මහත්මිය නිල බලයෙන් කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් කටයුතු කරන ලදි.

2021/12/31 දිනට රාජ්‍ය භාෂා කොමිෂන් සභාවෙහි සංවිධාන ව්‍යුහය



2021.12.31 දින වනවිට කොමිෂන් සභාවේ සේවයකළ කාර්ය මණ්ඩලය

අනු අංකය	නිල නාමය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	සටහන
01.	අධ්‍යක්ෂ	**01**	**-**	පුරප්පාඩු **01**
02.	සහකාර අධ්‍යක්ෂ	**01**	**01**	
03.	භාෂා නිලධාරි	**03**	**01**	පුරප්පාඩු **02**
04.	පරිපාලන නිලධාරි	**01**	**01**	
05.	මූල්‍ය නිලධාරි	**01**	**-**	පුරප්පාඩු **01**
05.	ප්‍රධාන ලිපිකරු	**01**	**01**	
06.	භාෂා ප්‍රවර්ධන හා විමර්ශන නිලධාරි	**10**	**04**	පුරප්පාඩු **06**
07.	සංවර්ධන නිලධාරි	**04**	**03**	පුරප්පාඩු **01**
08.	කළමනාකරණ සහකාර	**10**	**08**	පුරප්පාඩු **02**
09.	භාෂා පරිවර්තක (දෙමළ/ ඉංග්‍රීසි)	**01**	**-**	පුරප්පාඩු **01**
10.	භාෂා පරිවර්තක (සිංහල/ ඉංග්‍රීසි)	**01**	**-**	පුරප්පාඩු **01**
11.	භාෂා පරිවර්තක(සිංහල/ දෙමළ)	**01**	**-**	පුරප්පාඩු **01**
12.	රියදුරු	**03**	**02**	පුරප්පාඩු **01**
13.	කාර්යාල කාර්ය සහායක	**04**	**03**	පුරප්පාඩු **01**
	මුළු සංඛ්‍යාව	**42**	**24**	පුරප්පාඩු **18**

06. කොමිෂන් සභා රැස්වීම්

2021 වර්ෂයේ කොමිෂන් සභා රැස්වීම් **06** ක් පහත සඳහන් දිනවලදී පවත්වන ලද අතර ඇතැම් රැස්වීම් මාර්ගගත ක්‍රමයට පවත්වන ලදි.

රැස්වීම් දිනය	පවත්වන ලද ක්‍රමය
2021.01.29	ආයතනය තුළ
2021.03.17	ආයතනය තුළ
2021.04.22	ආයතනය තුළ
2021.07.29	ආයතනය තුළ
2021.11.11	ආයතනය තුළ
2021.12.23	මාර්ගගත ක්‍රමයට

07. වෙබ් අඩවිය ප්‍රතිනිර්මාණය කිරීම.

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ වෙබ් අඩවිය යාවත්කාලීන නොවූ අක්‍රීය තත්ත්වයක පැවතුණු බැවින් එමඟින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නොහැකිවිය. මෙම කරුණ කොමිෂන් සභාවේ අවධානයට යොමුවූ අතර එය ඉතා ඉක්මනින් ප්‍රතිනිර්මාණය කිරීමට තීරණය කරන ලදි. ඒ අනුව ජාතික භාෂා සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතියෙහි (NLEAP) තාක්ෂණික සහය ලබාගනිමින් වෙබ් අඩවිය ප්‍රතිනිර්මාණය කිරීමට පියවර ගන්නා ලදි.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සහ භාෂා අයිතිවාසිකම් පිළිබඳව මහජනතාව තුළ පවතින දැනුම සහ අවබෝධය වර්ධනය කළයුතුබව කොමිෂන් සභාව විවිධ අවස්ථාවලදී නිරීක්ෂණය කර ඇත.කොමිෂන් සභාව මඟින් ප්‍රකාශයට පත්කරන ලද සියලුම වාර්ෂික වාර්තා, නිර්දේශාවලි, පොත්, අත් පත්‍රිකා සහ පෝස්ටර ආදිය වෙබ් අඩවියට ඇතුළත් කර ඇති බැවින් මහජනතාවට අවශ්‍ය තොරතුරු වෙබ් අඩවිය මඟින් ලබාගැනීමට හැකිවේ. තවද, වෙබ් අඩවියෙහි ඇතුළත් කර ඇති චැට් බොට් (Chat bot) මඟින් තොරතුරු මහජනතාව වෙත සැපයීමේ කාර්යය වඩාත් කාර්යක්ෂම කර ඇත.

රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනත මඟින් භාෂා අයිතිවාසිකම් උල්ලංඝනයවීම් සම්බන්ධව මහජන පැමිණිලි විමර්ශනය සඳහා විශේෂිත බලතල කොමිෂන් සභාවට හිමිවී තිබේ. දුරකතන ඇමතුම් මඟින් සහ ලිපි මඟින් මෙවැනි පැමිණිලි කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වේ. තවද වෙබ් අඩවිය හරහාද කොමිෂන් සභාව වෙත මහජන පැමිණිලි ඉදිරිපත් කිරීමට අවකාශ සලසා ඇත.



ඡායාරූපය 1 - වෙබ් අඩවිය

08. කොමිෂන් සභාව නව කාර්යාල පරිශ්‍රයකට ගෙනඒම.

කොමිෂන් සභා කාර්යාලය පසුගිය කාලසීමාව තුළ පෞද්ගලික ගොඩනැගිලිවල පිහිටි කාර්යාල පරිශ්‍ර ගණනාවක පවත්වාගෙන ගොස් ඇත. මෙසේ කලින් කලට කාර්යාල පරිශ්‍රය වෙනස්කිරීම හේතුවෙන් අලුතෙන් කාර්යාල පරිශ්‍රය සැකසීම සහකාර්යාලීය උපකරණ ප්‍රවාහනයට අවශ්‍ය වියදම් දැරීමට සිදුවීම, කාර්යාල පරිශ්‍රය වෙනස්වීම නිසා සේවාලාභීන් අපහසුතාවයට පත්වීමවැනි අවාසිසහගත තත්ත්වයන් ගණනාවක් ඇතිවිය.

කොමිෂන් සභා කාර්යාලය අවසන්වරට පැවතියේ රාජගිරිය, බුත්ගමුව පාරේ අංක **40** ස්ථානයේ පිහිටි ගොඩනැල්ලෙනිය. අමාත්‍යාංශ විෂය පථය වෙනස්වීම හේතුකොටගෙන එම ගොඩනැගිල්ල බන්ධනාගාර අමාත්‍යාංශය යටතට පත්විය. ඉන්පසුව කොමිෂන් සභා කාර්යාලය පැවති කාර්යාල පරිශ්‍රය ඉතා ඉක්මනින් බන්ධනාගාර අමාත්‍යාංශය වෙත ලබාදෙන ලෙස දැනුම්දෙන ලදි. එම අවස්ථාවේ කොමිෂන් සභාවට කාර්යාල පරිශ්‍රයක් ලබාගැනීම සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කළද ඊට ප්‍රතිචාරයක් නොලැබුණි. ඉන්පසුව රාජගිරියෙහි පිහිටි ශ්‍රී ජයවර්ධනපුර කෝටටේ මහා නගර සභාවට අයත් ජනජයසිටි ගොඩනැගිල්ලෙන් කොමිෂන් සභාව සඳහා කාර්යාල පරිශ්‍රයක් වෙන්කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලදි. ඒ අනුව **2021** වර්ෂය තුළදී කොමිෂන් සභාව නාවල පාරේ පිහිටි "ජනජය සිටි" ගොඩනැගිල්ලේ වර්ග අඩි **4000**ක පමණ වන කාර්යාල පරිශ්‍රයට රැගෙනඒමට හැකිවිය. මෙම පරිශ්‍රය ලබා ගැනීමේදී විවිධ බාධකවලට මුහුණපෑමට කොමිෂන් සභාවට සිදුවිය. ඒවානම්,

i. **බොහෝමයක් රාජ්‍ය ආයතන මඟින් ජනජයසිටි ගොඩනැගිල්ලේ ඉතිරිවී තිබූ සීමිත කාර්යාල ඉඩ ප්‍රමාණය ඉල්ලුම්කර තිබීම. මෙයට හේතු වූයේ පෞද්ගලික හිමිකාරිත්වය දරන ගොඩනැගිලිවල පැවති සියලු රාජ්‍ය ආයතන රජය සතු ගොඩනැගිලිවලට රැගෙනඒමට ප්‍රතිපත්තිමය තීරණයකට එළඹ තිබීමයි.**
ii. **තැන්පතු මුදලක් ගෙවීමේ අවශ්‍යතාව.**
iii. **පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් නගර සභාව සමඟ අවශ්‍ය කටයුතු සිදුකිරීමට බාධා ඇතිවීම.**

කෙසේ වෙතත් නගර සභාව සමඟ අඛණ්ඩව සාකච්ඡා කිරීම මඟින් ජනජය සිටි ගොඩනැගිල්ලේ **9** වන මහලේ ඉතිරිව තිබූ වර්ගඅඩි **4000**ක කාර්යාල ඉඩ කොමිෂන් සභාවට ලබාගැනීමට හැකිවිය.මෙම කාර්යාල පරිශ්‍රය මූලිකව කල්බදු පදනම මත ලබාගෙන ඇති අතර තිස් අවුරුදු හෝ අනූනව අවුරුදු දීර්ඝකාලීන බදු පදනමට ලබාගැනීම සඳහා මූලික සාකච්ඡාවක් මේවනවිට පවත්වා ඇත.

දීර්ඝකාලීන බදු පදනම මත කාර්යාල පරිශ්‍රය ලබාගතහොත් කොමිෂන් සභාව "ජනජය සිටි" ගොඩනැගිල්ලේ දීර්ඝ කාලයක් පවත්වා ගැනීමට හැකියාව ලැබේ. එවිට කාර්යාල පරිශ්‍රය කලින්කලට වෙනස්කිරීම හේතුවෙන් ඇතිවන ගැටලු මඟහරවා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

කොමිෂන් සභාවෙහි වත්මන් කාර්යාලය පිහිටි "ජනජය සිටි" ගොඩනැගිල්ල රාජගිරිය නගර මධ්‍යයේ පිහිටා ඇත. එබැවින් පාර්ශවකරුවන්ට පහසුවෙන් කොමිෂන් සභාව වෙත ළඟාවියහැකිය. මෙම කාර්යාලය රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවටද ආසන්නව පිහිටා ඇති බැවින් කොමිෂන් සභාවේ නිලබලයෙන් ලේකම් වන රාජ්‍ය භාෂා කොමසාරිස්ගේ සේවයද පහසුවෙන් ලබාගැනීමේ හැකියාවක් ඇත.



ඡායාරූපය 2 - රාජ්‍ය භාෂා කොමිෂන් සභාව පිහිටුවා ඇති "ජනජය සිටි" ගොඩනැගිල්ල

II කොටස

මෙම කොමිෂන් සභාවේ කාර්යයන් ප්‍රධාන අංශ 04ක් යටතේ ඉටුකරනු ලැබේ.

1. අධීක්ෂණය
2. විමර්ශනය
3. අධ්‍යාපනය
4. උපදේශනය

ඉහත අංශවලට අදාළව 2021 වර්ෂයේ ඉටු කරන ලද ක්‍රියාකාරකම් පහත පරිදී වේ.

01. අධීක්ෂණය - භාෂා විගණන පැවැත්වීම.

භාෂා විගණන කොමිෂන් සභාවේ අධීක්ෂණ කාර්යයටඅදාළ වන ක්‍රියාකාරකමකි. මෙහිදී රාජ්‍ය ආයතනවල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව කොමිෂන් සභාව සෘජුව පරීක්ෂාවට ලක්කරහඳුනාගනු ලබන රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූල නොවන තත්ත්වයන් සම්බන්ධයෙන් නිර්දේශ නිකුත් කිරීම සහ එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම කොමිෂන් සභාව මගින් සිදුකරනු ලබයි.

පහත සඳහන් නිර්ණායකයන්ට අනුව භාෂා විගණන සිදු කරනු ලබයි.

1. ආයතන පරිශ්‍රයේ මහජන ප්‍රදර්ශනය කරනු ලබන සියලුම පුවරු, (නාම පුවරු, තොරතුරු පුවරු, උපදෙස් පුවරු)
2. මහජන සේවය සඳහා භාවිතාකරනු ලබන සියලුම ලේඛන
3. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් දැනුවත්භාවය
4. නිලධාරීන්ගේ සන්නිවේදන හැකියාව
5. සිංහල/ දෙමළ පුහුණු පාඨමාලා පැවැත්වීම
6. නිලධාරින්ගේ භාෂා ප්‍රවීණතාවය
7. වෙබ් අඩවිය
8. පරිවර්තන කටයුතු
9. පිවිසුම් කාර්යාල පසුබිම
10. ආයතනයට අදාළ විශේෂිත කරුණු (උදා-: පොලිස්ථාන - පැමිණිලි සටහන් කිරීම උප්පැන්න/ විවාහ/ මරණරෙජිස්ට්‍රාර් - සහතිකපත්‍රරාජ්‍යභාෂාවලින්ලබාදීම.)

මෙම පරීක්ෂාවේදි රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් පවතින අනනුකූලතාවයන් සියල්ල හඳුනාගනු ලැබේ. එම අනනුකූලතාවයන් නිවැරදි කිරීම සඳහා අදාළ ආයතන ප්‍රධානියා වෙත නිර්දේශ නිකුත් කෙරේ.එම නිර්දේශ මාස 3ක කාලසීමාවක් තුළදී ක්‍රියාත්මක කර කොමිෂන් සභාව වෙත වාර්තා කළ යුතුය.මෙම වර්ෂය තුළදී සිදුකළ භාෂා විගණන පිළිබඳ තොරතුරු පහත වගුව මගින් දැක්වේ.

අනු අංකය	විගණන සිදුකළ ආයතන	දිනය
1.	මහජන බැංකුව-මූලස්ථානය	2021.01.06
2.	ලංකා බැංකව-මූලස්ථානය	2021.01.14
3.	ශ්‍රී ජයවර්ධන පුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	2021.04.07
4.	දෙනිවලප්‍රාදේශීය ලේකම් කාර්යාලය	2021.01.20
5.	මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	2021.01.20
6.	ආගමන හා විගණන දෙපාර්තමේන්තුව	2021.01.09
7.	ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය	2021.01.06
8.	මැතිවරණ කොමිෂන් සභාව	2021.02.09
9.	අධ්‍යාපන අමාත්‍යාංශය	2021.02.11
10.	ශ්‍රී ලංකා රක්ෂණ සමාගම	2021.03.10
11.	අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව;	2021.03.19
12	ජාතික ඉතිරිකිරීමේ බැංකුව- මූලස්ථානය	2021.03.31
13	විභාග දෙපාර්තමේන්තුව;	2021.04.01
14	රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	2021.04.07



ඡායාරූපය 3 - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව



ඡායාරූපය 4 - ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය



ඡායාරූපය 5 - ශ්‍රීලංකාරක්ෂණසමාගම



ඡායාරූපය 6 - විභාගදෙපාර්තමේන්තුව

02. විමර්ශනය - පැමිණිලි විමර්ශනය

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝනය වීම සම්බන්ධයෙන් ලැබෙන මහජන පැමිණිලි විමර්ශනය සඳහා කොමිෂන් සභා පනත මඟින් කොමිෂන් සභාව වෙත විශේෂිත බලතල හිමිවී ඇත. පැමිණිලි විමර්ශනය කොමිෂන් සභාවේ එක් ප්‍රධාන කාර්යයක් වන අතර. කොමිෂන් සභාව වෙත පහත ආකාරවලින්පැමිණිලි ඉදිරිපත් වේ.

01. ලිපි මඟින්
02. කොමිෂන් සභාව වෙත පැමිණ ඉදිරිපත් කිරීමෙන්
03. මුද්‍රිත මාධ්‍යවල පළවන පැමිණිලි
04. විද්‍යුත් තැපෑල
05. දුරකථන පණිවුඩ
06. **071-9521436** ජංගම දුරකථන අංකය මඟින්

පසුගිය වර්ෂවලට සාපේක්ෂව මෙම වර්ෂයේ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වූ පැමිණිලි සංඛ්‍යාව අඩු අගයක් වේ. මෙයට හේතු වන්නේ පෙර වසරවලදී **1956** අංකය මඟින් පැමිණිලි විශාල සංඛ්‍යාවක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත්වීමයි. **2021** වර්ෂය වනවිට එම අංකය අක්‍රීය තත්ත්වයට පත්වීම හේතුවෙන් එමඟින් ඉදිරිපත් වන පැමිණිලි සම්පූර්ණයෙන්ම නැවතුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වූ පැමිණිලි සංඛ්‍යාවෙහි සැලකියයුතු අඩුවක් නිරීක්ෂණය වේ.

සමාලෝචිත වර්ෂය තුළ කොමිෂන් සභාව වෙත පැමිණිලි **13**ක් ඉදිරිපත් වී ඇත. පෙර වර්ෂයේ නොවිසඳුණ පැමිණිලිද ඇතුළත්ව මෙම වර්ෂයේදී පැමිණිලි **56**ක විමර්ශනය කරන ලදි. එසේ විමර්ශනය කරනලද විශේෂිත පැමිණිලි කිහිපයක් පහත වගුවේ දැක්වේ.

පැමිණිල්ල	ගත් ක්‍රියාමාර්ග
කොළඹ අංක **01** කම්කරු විනිශ්චයාධිකාර සභාවේ සහකාර ලේකම්වරයා දෙමළ ජාතික කාන්තාවකට හා දෙමළ ජාතික පුද්ගලයෙකුට ඔවුන් රැගෙන ආ මුද්‍රිත ලේඛන ඉවත දැමීමෙන් හා බැනවැදීමෙන්සිදුකළ විෂමචාරය	රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ නිලධාරින් විසින් **2021.01.18** දින කොළඹ අංක **01** කම්කරු විනිශ්චයාධිකාර සභාවේ දී මේසම්බන්ධව විමර්ශනයක් සිදුකරන ලදි. එමෙන්ම අධිකරණ අමාත්‍යාංශය වෙතින් ද මේ සම්බන්ධව කරුණු විමසන ලදි. ඒ අනුව මහජනතාව ඉල්ලුම් කරන රාජ්‍ය භාෂාවෙන් සේවය ලබාදිය හැකි නිලධාරින් පත්කිරීමට කටයුතු කරන ලෙස නිර්දේශ ලබා දී ඇත.
උඩුපුස්සැල්ලාව එමස්ටි වත්ත අසළ පිහිටි සමෘද්ධි සංවර්ධන බැංකුවෙහි ප්‍රධාන නාම පුවරුවෙහි දෙමළ භාෂාවේ අක්ෂර දෝෂ සහිත වීම.	මේ සම්බන්ධයෙන් උඩුපුස්සැල්ලාව සමෘද්ධි බැංකුවේ කළමනාකරු වෙතින් නිරීක්ෂණ කැඳවාලිපි යවා ඇත. නමුත් මෙවැනි බැංකුවක් එමස්ථානයේ නොමැති බව සඳහන් කරමින් ලිපිය ආපසු එවා ඇත. මේ සම්බන්ධයෙන් පැමිණිලිකරු දැනුවත් කර ඇත.

බස්නාහිර පළාත් ආදයම් දෙපාර්තමේන්තුව මගින් මහජනතාව වෙත නිකුත් කරන 1990 අංක 06 දරන බස්නාහිර පළාත් මුදල් ප්‍රඥප්තියේ 62 වගන්තියේ විධිවිධාන පරිදි මුද්දර ගාස්තු වටිනාකම පිළිබඳ මතය ලබාගැනීමේ ඉල්ලුම්පත්‍රය සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පැවතීම.	ඉල්ලුම් පත්‍රය දෙමළ භාෂාවෙන් සකස්කර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදි. එම ලේඛනයේ පැවති අක්ෂර දෝෂයන්ද නිවැරදි කරන ලෙස පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇත.
බෙලිඅත්ත පොලිස් ස්ථානයේ ප්‍රධාන නාමපුවරුවෙහි "බෙලිඅත්ත" යන්න දෙමළ භාෂාවෙන් අක්ෂර දෝෂ සහිතව ප්‍රදර්ශනය කර ඇති බව	මේ සම්බන්ධයෙන් බෙලිඅත්ත පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වෙතින් නිරීක්ෂණ කැඳවා ලිපි යවා ඇත . අදාළපුවරුවෙහි දෙමළ භාෂා අක්ෂර දෝෂ සකස් කිරීමට නිර්දේශ ලබා දීඇත.
නුවරඑළිය ප්‍රාදේශිය සභාව විසින් නුවරඑළිය පොදුබස් නැවතුම්පොළ යනුවෙන් ප්‍රදර්ශනය කර ඇති නාමපුවරුවෙහි "නුවරඑළිය" යන්න දෙමළ භාෂාවෙන් වැරදි ලෙස සටහන් කර තිබීම.	මේ සම්බන්ධයෙන් නුවරඑළිය ප්‍රාදේශිය සභාවේ ලේකම් වෙතින් නිරීක්ෂණ කැඳවා ලිපි යවා ඇත.
හෝමාගම විදුලිබල මණ්ඩලයේ ප්‍රධාන නාම පුවරුවෙහි දෙමළ භාෂා අක්ෂරදෝෂ ඇති බව	මේ සම්බන්ධයෙන් හෝමාගම විදුලිබල මණ්ඩලයේ ප්‍රධාන ඉංජිනේරුවරයාගෙන් විමසීම් කරන ලදි. ඒ අනුව ප්‍රධාන නාමපුවරුව නිවැරදිව සකස් කිරීමට අදාළ නිර්දේශ ලබා දීඇත.
අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසැල් පුස්තකාල සංවර්ධන ශාඛාව මගින් ප්‍රදර්ශනය කර ඇති නාමපුවරුවෙහි දෙමළ භාෂාවෙහි දෝෂ පවතින බව.	මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙතින් නිරීක්ෂණ කැඳවා ලිපි යවා ඇත .අදාළ පුවරුව නිවැරදිව සකස් කිරීමට අවශ්‍ය නිර්දේශ ලබා දී ඇත.
අධිකරණ අමාත්‍යාංශය මගින් සාමදාන විනිශ්චයකාර ධුරය සඳහා ලබාදෙන අයඳුම්පත්‍රය පිරවීමට ලබා දී ඇති උපදෙස් පත්‍රිකාවේ "අයඳුම්පත්‍රයේ සිංහල හෝ ඉංග්‍රීසි භාෂාවෙන් පැහැදිලි අකුරෙන් සම්පූර්ණ කළයුතු බව" සඳහන් කර ඇති බවත්, එහි දෙමළ භාෂාවෙන් සම්පූර්ණ කිරීමට එපා කියාසඳහන් කර ඇත්තේ කුමන හේතුවක් මත ද යන්න විමසා ඇත.	මේ සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙතින් නිරීක්ෂණ කැඳවා ඇත. අදාළ අයඳුම්පත්‍රය පිරවීමට ලබා දී ඇති උපදෙස් පත්‍රිකාව භාෂාත්‍රයෙන් සකස්කිරීමට අවශ්‍ය නිර්දේශ ලබා දී ඇත.

ගම්පහ මිනින්දෝරු දෙපාර්තමේන්තු කාර්යාලයේ ලිපිශිර්ෂයෙහි දෙමළ භාෂා අඩුපාඩු ඇති බව දන්වා ඇත.	මේ සම්බන්ධයෙන් ගම්පහ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙතින් නිරීක්ෂණ කැඳවා ඇත. ලිපිශිර්ෂයේ දෙමළ භාෂා අඩුපාඩු සකස් කිරීමට අවශ්‍ය නිර්දේශ ලබා දී ඇත.
ගම්පහ ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ ප්‍රාදේශිය කාර්යාලයේ ලිපිශිර්ෂයෙහි දෙමළ සහ සිංහල භාෂා අඩුපාඩු ඇති බව දන්වා ඇත.	මේ සම්බන්ධයෙන් ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ ගම්පහ කාර්යාලයේ නියෝජ්‍ය කොමසාරිස් වෙතින් නිරීක්ෂණ කැඳවා ඇත. ලිපිශිර්ෂයේ සිංහල සහ දෙමළ භාෂා අඩුපාඩු සකස් කිරීමට අවශ්‍ය නිර්දේශ ලබා දී ඇත.
ගම්පහ කලාප අධ්‍යාපන කාර්යාලයේ ලිපි ශීර්ෂයෙහි දෙමළ සහ සිංහල භාෂා අඩුපාඩු ඇති බව	මේ සම්බන්ධයෙන් කලාප අධ්‍යාපන කාර්යාලයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් නිරීක්ෂණ කැඳවා ඇත. ලිපි ශීර්ෂයේ සිංහල සහ දෙමළ භාෂා අඩුපාඩු සකස් කිරීමට අවශ්‍ය නිර්දේශ ලබා දී ඇත.
මොරටුව විශ්වවිද්‍යාලය මගින් පැවැත් වූ උපාධිප්‍රදානෝත්සවය සඳහා ආරාධිතයින් වෙත ලබාදුන් ආරාධනා පත්‍රයේ "බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව" යන්නෙහි දෙමළ භාෂා වැරදි ඇති බව	මේ සම්බන්ධයෙන් මොරටුව විශ්වවිද්‍යාලයේ රෙජිස්ට්‍රාර් වෙතින් නිරීක්ෂණ කැඳවාඇත. ඉදිරියේ දී උපාධි ප්‍රදානෝත්සවය සඳහා ලබාදෙන ආරාධනා පත්‍රය නිවැරදිව භාෂාත්‍රයෙන් සකස් කිරීමට නිර්දේශ ලබා දී ඇත.
ප්‍රවාහන අමාත්‍යාංශයේ ලිපි ශිර්ෂයේ දෙමළ භාෂාව නොමැති බව සඳහන් කරමින් සමාජ මාධ්‍ය තුළ ප්‍රචාරය වීම	මේ සම්බන්ධයෙන් ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම් වෙතින් නිරීක්ෂණ කැඳවා ඇත. ලිපි ශීර්ෂයේ දෙමළ භාෂාව ඇතුළත් කර සකස් කිරීමට අවශ්‍ය නිර්දේශ ලබා දී ඇත.

03. අධ්‍යාපනය - දැනුවත් කිරීමේ වැඩසටහන්

කොමිෂන් සභාව මඟින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවල නිලධාරින් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. මෙම වැඩසටහන්වල මූලික අරමුණ වන්නේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි නෛතික පසුබිම සහ නිලධාරින්ගේ වගකීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමයි. රාජ්‍ය ආයතනවල සේවා සැපයුම රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව පවත්වාගැනීම මෙමගින් අපේක්ෂා කරයි. තවද, කොමිෂන් සභාව මඟින් භාෂා අයිතීන් සම්බන්ධයෙන් මහජනතාව දැනුවත්කිරීමද සිදුකරනු ලැබේ. මේ සඳහා විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය භාවිත කරන අතර එමඟින් භාෂා අයිතීන් පිළිබඳව ජනතාවගේ දැනුම සහ අවබෝධය වර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

2021 වර්ෂයේ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් අපේක්ෂිත පරිදි දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය. කෙසේවෙතත් ඇතැම් අවස්ථාවලදී Zoom තාක්ෂණයද භාවිත කරමින් පහත වගුවේ දැක්වෙන වැඩසටහන් සහ ක්‍රියාකාරකම් මෙම වර්ෂයේදී සිදුකරන ලදි.

අනු අංක	දැනුවත් කිරීම් වැඩසටහන්	දිනය
01.	මවු භාෂා දිනය වෙනුවෙන් පුවත්පත් ලිපි පළ කිරීම(ඇමුණුම I සහ II බලන්න)	28.02.2021
02.	සිංහල භාෂා දිනය වෙනුවෙන් මාධ්‍යවේදීන් සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහන	03.03.2021
03.	රුහුණු විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහන	18.06.2021
04.	කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීයින් සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහන	26.07.2021
05.	ජාත්‍යන්තර සංඥා භාෂා දිනය වෙනුවෙන් පවත්වන ලදදැනුවත් කිරීමේ වැඩසටහන	24.09.2021

සිංහල භාෂා දිනය වෙනුවෙන් මාධ්‍යවේදීන් දැනුවත් කිරීම සඳහා පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහනෙහි ප්‍රධාන දේශනය සිංහල ලේඛන රීතිය හා නිරවද්‍ය භාෂා භාවිතය මැයෙන් මහාචාර්ය සඳගෝමි කෝපරහේවා විසින් පවත්වන ලදි. ඒ සඳහා මාධ්‍යවේදීන් 44ක් සහභාගි විය.

කොළඹ විශ්ව විද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයේ පළමු වසර විද්‍යාර්ථීන් සඳහා මාර්ගගත ක්‍රමයට පවත්වන ලද රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනට සිසුන් 100 පමණ සහභාගී විය. එමෙන්ම රුහුණු විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ විද්‍යාර්ථීන් සඳහා පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සිසුන් 200ක් පමණ සහභාගී විය.

සැප්තැම්බර් මස 25 දිනට යෙදෙන ජාත්‍යන්තර සංඥා භාෂා දිනය වෙනුවෙන් මාර්ගගත ක්‍රමයට පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහනට කොමිෂන් සභාවේ නිලධාරීන් සහභාගී විය.

සිංහල භාෂා දිනය වෙනුවෙන් මාධ්‍යවේදීන් දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා පදනම් ආයතනයේ පවත්වන ලද වැඩසටහන



ඡායාරූපය 7 - සභාපතිවරයා සභාව අමතන අවස්ථාව



ඡායාරූපය 10 - වැඩසටහනට සහභාගී වූ මාධ්‍යවේදීන්

04. ජාතික භාෂා සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතිය (NLEAP) සමඟ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

ශ්‍රී ලංකා රජය සහ කැනඩා රජය අතර ඇතිකරගෙන ඇති ද්වි පාර්ශවික ගිවිසුමකට අනුව ජාතික භාෂා සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතිය(NLEAP) මඟින් කොමිෂන් සභාවේ කාර්යයන්ට අවශ්‍ය තාක්ෂණික සහය ලබාදෙනු ලැබේ. මෙම වර්ෂයේදී පහත දැක්වෙන වැඩසටහන් සඳහා ව්‍යාපෘතිය කොමිෂන් සභාව වෙත තාක්ෂණික සහය ලබාදී ඇත.

1) මාර්ගගතව තාක්ෂණික දැනුම හුවමාරු කරගැනීමේ වැඩසටහන් පැවැත්වීම.

කැනේඩියානු රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ කාර්යයන් ඉටුකරගනු ලබනආකාරය සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාවේ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා මාර්ගගත ක්‍රමය යටතේ තාක්ෂණික දැනුම හුවමාරු කරගැනීමේ මාර්ගගත වැඩසටහන් පෙළක් පවත්වන ලදි. මෙම වැඩසටහන්වල සම්පත් දායකයින් වශයෙන් කටයුතු කරන ලද්දේ කැනේඩියානු රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ නිලධාරීන්ය. පහත දැක්වෙන ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදී මෙම වැඩසටහන් පවත්වන ලදි.

i. වාර්ෂික වාර්තා පිළියෙළ කිරීම.
ii. මහජන පැමිණිලි විමර්ශනය.
iii. භාෂා අයිතීන් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම.
iv. සමීක්ෂණ සහ පරීක්ෂණ පැවැත්වීම.

2) පාසල් ළමුන් සඳහා දීප ව්‍යාප්ත රචනා තරඟයක් පැවැත්වීම.

2021 වර්ෂය තුළ කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පාසැල් නිසිලෙස පැවැත්වීමට නොහැකි වූ වාතාවරණය තුළ පාසැල් ළමුන් නිවෙස්වලට වී කාලය ගතකරන තත්ත්වයක් පැවතුණි. මෙම කාලසීමාවේදී පාසැල් ළමුන් ඵලදායීකාර්යයන්ට සම්බන්ධකර ගැනීමේ අරමුණින් කොමිෂන් සභාව ජාතික භාෂා සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතියේ සහාය ඇතිව දීප ව්‍යාප්ත රචනා තරඟයක් පවත්වන ලදි. කොමිෂන් සභාවේ උපදෙස්වලට අනුකූලව සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුනෙන්ම රචනා 1200 කොමිෂන් සභාව වෙත ලැබුණි. මෙම රචනා තරඟයේ ත්‍යාග ප්‍රදානෝත්සවය 2022 වර්ෂයේ පැවැත්වීමට සැළසුම්කර තිබුණි.

3) පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන.

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව මඟින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් පාර්ශවකරුවන් දැනුවත් කිරීම සිදුකරනු ලැබේ. මෙම දැනුවත්කිරීම් මූලිකවම රාජ්‍ය නිලධාරීන්, අර්ධ රාජ්‍ය ආයතනවල නිලධාරීන්, මහජනතාව සහ පාසැල් ළමුන් සඳහා පවත්වනු ලැබේ.

රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ආයතන ප්‍රධානීන් රැස්කර සිදුකරනු ලැබේ. මෙම වැඩසටහන් සඳහා සම්පත් දායකයන් ලෙස කටයුතු කරන්නේද කොමිෂන් සභාවේ නිලධාරීන් බැවින් එම නිලධාරීන් පුහුණු කිරීමේ අවශ්‍යතාවක් පැවතුණි. එම අවශ්‍යතාව සපුරාලීම සඳහා ජාතික භාෂා සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතියේ (NLEAP)තාක්ෂණික සහය මත පුහුණුකරුවන් පුහුණු කිරීමේ තෙදින වැඩමුළුවක් මෙම වසරේදී ගෝල්ෆේස් හෝටලයේදී පවත්වන ලදි.

4) රාජ්‍ය භාෂා කොමිෂන් සභාවෙහි සංවිධාන ව්‍යූහය ප්‍රතිනිර්මාණය කිරීම.

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවෙහි ආයතනික ව්‍යූහය කොමිෂන් සභා පනතෙහි අරමුණු සමඟ ගැළපෙන පරිදි විධිමත්ව නිර්මාණය කර නොතිබුණි. එබැවින් ජාතික භාෂා සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතියේ තාක්ෂණික සහාය මත කොමිෂන් සභාවේ ආයතනික ව්‍යූහය, එහි අරමුණු හා ගැළපෙන ආකාරයට ප්‍රතිනිර්මාණය කර යෝජනාවක් ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදි.

කොමිෂන් සභාව ඉහතින් සඳහන් කළ සියලුම ක්‍රියාකාරකම් සිදුකරන ලද්දේ රටතුළ කොවිඩ් 19 වසංගතය පැවති අවස්ථාවකය. මෙම කාලසීමාවේදී ඇතැම්විට පහත දැක්වෙන බාධක කාර්යාල කටයුතුවලට බලපෑමය.

i. රජයේ කාර්යාල වැසීම.
ii. සීමාසහිතව කාර්ය මණ්ඩල සේවයට කැඳවීම.
iii. දිස්ත්‍රික් සහ පළාත් සංචරණ සීමා පැනවීම.
iv. නිරෝධායන ඇඳිරි නීතිය පැවතීම.
v. රැස්වීම් පැවැත්වීමට නොහැකිවීම.
vi. වෙනත් රාජ්‍ය ආයතන වෙත ගොස් රාජකාරි ඉටුකිරීමට සීමා පැනවීම.
vii. පාසැල් වැසීම.

කොමිෂන් සභාවේ බොහෝමයක් ක්‍රියාකාරකම් සඳහා රාජ්‍ය නිලධාරීන්, මහජනතාව සහ පාසැල් සිසුන් සමඟ සම්බන්ධ කරගනු ලැබේ. ප්‍රධානතම ක්‍රියාකාරකමක් වන භාෂා විගණන සිදුකිරීමේදී කොමිෂන් සභාවේ විමර්ශන කණ්ඩායම වෙනත් රාජ්‍ය ආයතන වෙත ගොස් හඳුනාගත් නිර්ණායකයන්ට අනුකූලව භෞතිකව එම කාර්යය සිදුකරයි. එහෙත් ඉහත දැක්වෙන සීමාකාරී තත්ත්වයන් හේතුකොටගෙන 2021 වර්ෂයේ සිදුකිරීමට හැකිවූයේ භාෂා විගණන 14ක් පමණි. වෙනත් වර්ෂවලදී විගණන 60 ඉක්මවා සිදුකරනු ලැබේ.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සහ භාෂා අයිතිවාසිකම් සම්බන්ධයෙන් පාර්ශවකරුවන් දැනුවත්කිරීම කොමිෂන් සභාව මඟින් සිදුකෙරේ. රැස්වීම් පැවැත්වීම සීමා කිරීම හේතුවෙන් මෙවැනි වැඩසටහන් අපේක්ෂිත පරිදි සිදුකිරීමට නොහැකිවිය. විකල්පයක් වශයෙන්, මාර්ගගත ක්‍රමය යටතේ සීමිත වැඩසටහන් කිහිපයක් මෙම වර්ෂයේදී පවත්වන ලදි. තවද පාසැල් අඛණ්ඩව වසා තැබීම හේතුවෙන් පාසල් භාෂාකව ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් ද සිදුකිරීමට නොහැකිවිය.

කොමිෂන් සභා රැස්වීම්ද පැවති වසංගත තත්ත්වය මත සෞඛ්‍ය නිර්දේශවලට අනුකූලව කොමිෂන් සභා කාර්යාලයේ පවත්වන ලද අතර අවශ්‍ය අවස්ථාවලදී මාර්ගගත ක්‍රමය ඔස්සේද රැස්වීම් පවත්වන ලදි.

2021 වර්ෂයෙහි කොමිෂන් සභාවේ කාර්ය සාධනය කෙරෙහි පැවති කොවිඩ් වසංගත තත්ත්වය සැලකියයුතු ලෙස බලපා ඇති බව ඉහත කරුණු වලින් පැහැදිලි වේ.

ඇමුණුම I



தாய்மொழி பயன்பாடு படிப்படியாக அருகிச் செல்வது ஆபத்தான அறிகுறி!

புதிய கற்பித்தல் பொறிமுறைகளை உள்வாங்கி தமிழ் மொழியைக் கற்பிப்பதே இலகுவான வழி

சர்வதேச தாய்மொழித் தினம் இன்று

பலருக்கும் தெரியாத தமிழ் மொழியின் சிறப்புகள்!

புலம்பெயர் தமிழர்களின் எதிர்கால சந்ததியினரிடமிருந்து படிப்படியாக தூர விலகுகின்றது தமிழ்மொழி!



දිවයින

වෂී 2021ක් වූ පෙබරවාරි මස 21 වැනිදා ඉරිදා

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ සභාපති නීතිඥ ඩී.කනගසූරිය

ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ සම්මානිත මහාචාර්ය මාලනී අඳඟමණ

කැලණි සරසවියේ ආචාර්ය සවිතා රාජරත්නම්

කොළඹ සරසවියේ මහාචාර්ය සඳකෝම් කෝපරබෝවා

කොළඹ සරසවියේ මහාචාර්ය දුෂ්මන්ත මෙන්ඩිස්

පෙබරවාරි 21 වැනි දිනට යෙදෙන ආන්තර්ජාතික මවුභාෂා දිනය නිමිත්තෙනි

මවු භාෂාව භාවිත කිරීමට ලැබීම ඕනෑම මානව වර්ගයක අයිතියකි!

ලෝක භාෂා දිනය සැප්තැම්බර් 26 දින සමරනවා. නමුත් ජාත්‍යන්තර මවු භාෂා දිනය සැමරීම පෙබරවාරි 21 දිනට යෙදෙනවා. එය ආරම්භ කළබව 1999 පෙබරවාරි 21 දින දැනුම්දෙන ලද්දේ UNESCO ආයතනය විසිනි. මෙම දිනයේ අරමුණ රටක පවතින පැරණිම භාෂා ආරක්ෂා කිරීම. භාෂාව පෝෂණය කිරීමට අනිවාර්යයෙන් පැරණි සාහිත්‍ය හා සම්ප්‍රදාය අවශ්‍යය වෙනවා. එසේත් නොමැතිව කථන භාෂාවෙන් පමණක්ම මවු භාෂාව පෝෂණය අපහසුයි

● සවිනි ඉමල්ෂා

භාෂාමය සංස්කෘතික විවිධත්වය සහ බහු භාෂා භාවිතය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් අන්තර්ජාතික මවුභාෂා දිනය පෙබරවාරි 21 වැනි දින වන සැමරෙයි. ලෝ වසියන් විසින් භාවිත කරනු ලබන සියලු භාෂා සංරක්ෂණය හා ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව සැමරෙන ජාත්‍යන්තර මවු භාෂා දිනය 2021 වර්ෂයේ සේනාව වන්නේ බහුභාෂා පෝෂණය අධ්‍යාපනයට හා සමාජයට මිහඟු ප්‍රවේශයක් යන්නයි. මවු භාෂාව යන්න තුම්ස්ද ලෙස කරලව අවිරි නැත්වුවහොත් භාෂාව තමන්ට උපතින් හිමි වන භාෂාව එසේත් නැතිනම් උපතේ සිට සීරුමාරුමය කාලයක් තුළ ඉගිනීම් ලෙස ගන්නා බස කරලු වශයෙන් මවු භාෂාව ලෙස අර්ථකථනය කළ හැකිය.

ලොව වැඩිපුරම කතා කරන භාෂාව ඉංග්‍රීසි භාෂාව ලෙස සැලකුවත් ඉංග්‍රීසි භාෂාව කතා කරන ජන සංඛ්‍යාව පසුවන්නේ ලොව තෙවැනි ස්ථානයේයි. ලොව වැඩිපුරම කතා කරන භාෂාව චීන භාෂාවයි (මැන්ඩරින්). දෙවැනි ස්ථානය හිමි වනු ලබන්නේ ස්පාන්ඤ භාෂාවටයි. දෙමළ භාෂාව විසි වන ස්ථානයේ පසුවන අතර සිංහල භාෂාවට හිමි හිමිවන්නේ හැට දෙවන ස්ථානයයි. මෙය ඉතා දුක්ඛිත තත්ත්වයකි. භාෂාවක් ඉදිරියට පවත්වාගෙන යාමේදී වඩාත් වැදගත් වෙනු ලබන්නේ කථනයයි. ලොව භාවිත වන භාෂා පිටට අනුවක් තරම් බහුතර භාෂා ප්‍රමාණයක් වශවහාර කරන්නේ සමස්ත ලෝක ජනගහනයෙන් සියයට හතරක් තරම් ඉතා සුළු පිරිසකි. ජාත්‍යන්තර භාෂා දිනය සමරනුයේ විශ්ව භාෂා අද මුහුණ පා ඇති අභියෝග හඳුනා ගෙන ඊට විසඳුම් සෙවීමේ අරමුණිනි.

වර්තමාන ලෝකයේ වශවහාරික භාෂාව පිළිබඳව සිදු කරන ලද පරීක්ෂණයකදී දැනට ලෝකය පිළිගත් භාෂා 6912 ක් වශවහාර වන බව හඳුනා ගෙන තිබේ. එයින් භාෂා දහයක් පමණ වඩාත ජනතා ගෙන තිබේ. එයින් භාෂා දහයක් පමණ වඩාත ජනතා භාෂාය. එසේම වශවහාරයේ පවතින භාෂා තුනෙන් 50% කට වඩා වැඩි ගණනක් වශවහාරයෙන් අවසන් මිදු භාෂා ලැයිස්තුවට එක් වීමේ අවධානමක් පවතියි. එවැන් භයානකම කරුණ වන්නේ මෙම භාෂා අතරින් එක් භාෂාවක් සෑම සති දෙකක් තුළ ම ලොවට අහිමි වීමයි.

මේ පිළිබඳව හා මෙවර මවුභාෂා දිනයට සම්බන්ධීව රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ සභාපති නීතිඥ ඩී.කනගසූරිය අදහස් දැක්වූවේ මේ ලෙසිනි.

"මෙම මවුභාෂා දිනය වශයෙන් ප්‍රකාශ කරලා 2000 දී රටවල් 188ක් ජාත්‍යන්තර වශයෙන් මවුභාෂා දිනය සමරනවා. ඒ අනුව කෙසේ මේ දිනය පෙබරවාරි 21 මවුභාෂා දිනය විදියට යොදා ගත්තේ. ලංකාව තුළත් විවිධ ජාතීන් කුවා කණ්ඩායම් වශයෙන් ජීවත් වෙනවා. ඔවුන් ඔවුන්ගේ මවුභාෂාව කවුන්ගේ ගණාකීකව, ඔවුන්ගේ සැතීන් අතර භාවිත කරනවා.

කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අංශ ප්‍රධාන මහාචාර්ය සඳකෝම් කෝපරබෝවා මෙවර මවුභාෂා දිනය වෙනුවෙන් තම අදහස් දැක්වූයේ මේ ලෙසිනි.

බහුභාෂිකත්වය ලෝකය පුරාම දකින්නට ලැබෙන සංසිද්ධියක්. ඒ රටවල් වලින් වැඩි ප්‍රමාණයක් බහුභාෂිකයි. ඒකභාෂික සියන රටවල් අද නැහැ. ඒ අතරම තියෙන අනිත් කාරණය තමා ඉංග්‍රීසි වැනි විශ්ව භාෂාවක් වාර්ත්ත වෙන නිසා ඒ රටවල සියන මවු භාෂාවලට විශාල බලපෑමක් එල්ල වෙමින් තියනවා, මවුභාෂා දිනයේ තියන වැදගත්කම තමයි ඉංග්‍රීසි වැනි විශ්ව භාෂා හමුවේ මවුභාෂාවට ඇති තර්ජනය.

ස්වදේශී භාෂා ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම ඒ භාෂාවල සියන තොරතුරු ලේඛනගත කිරීමේ අවශ්‍යතාවක් තියනවා. අද තියෙන විශේෂ කාරණයක් තමා ලංකාව වැනි රටක සිංහල, දෙමළ රාජ්‍ය භාෂා වශයෙන් භාවිත වුවත් ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන වශයෙන් අපේ අධ්‍යාපනය පරිපාලනයට හා වාණිජ වැනි ක්ෂේත්‍රවල වැඩ බලපෑමක් කිරීම.

යම්කිසි ආකාරයකට මවු භාෂාව අනහැර ඉංග්‍රීසි වැනි භාෂාවක් සම්පූර්ණයෙන් අධ්‍යාපනය මාර්ගය බවට පත් වුණොත් ඒ දැනුම ස්වභාෂා වලින් ප්‍රකාශයට පත් වෙන්නෙ නැහැ. එමෙම තත්ත්වයක් ආවොත් සාමාන්‍ය ජනයාගේ එදිනෙදා කතා බහ පමණක් මවුභාෂාවට සීමා වෙන්න පුළුවන්.

කොළඹ විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි අධ්‍යයන අංශයේ මහාචාර්ය දුෂ්මන්ත මෙන්ඩිස් මවුභාෂාව පිළිබඳවත් තම වැදගත්කමත් වෙනස් විදියකට ප්‍රකාශ කළේය. 'මම හිතන විදිහට මේ පාර කේතාව ගොඩක් උච්චයි. මොකද ශ්‍රී ලංකාව බහුභාෂික රටක්.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන භාෂා දෙකක් තියෙනවා. ඒ සිංහල සහ දෙමළ. ඊට අමතරව ඉංග්‍රීසි කතා කරන අයත් ඉන්නවා. ඒ වගේම තවත් භාෂා කුණක් තියෙනවා.

ශ්‍රී ලංකා මැලේ, ශ්‍රී ලංකා පාකුයීසි, ශ්‍රී ලංකාවේ ආදිවාසීන්ගේ භාෂාව. අඩුම ගානේ ලංකාව තුළ මවු භාෂාව කියලා භාෂා 6 කට අඩිට කියන්න පුළුවන්. හැබැයි දැන් අධ්‍යාපනය අනිත් බලපෑමකට ලංකාවේ පාසල්වල උගන්වන්නේ ඔය භාෂා හයෙන් කුනක් පමණයි. ඒ සිංහල, දෙමළ, ඉංග්‍රීසි. අනිත් භාෂා පාසල්වල උගන්වන්නේ නැහැ.

මම ඒ එක්කම භාෂා අයිතිවාසිකම් අනින් බලන විට එතනත් උල්ලංඝණය වෙනවා කියලා මම කියනවා. එයාලගේ මවු භාෂාව අපි අනුමත කරන්නේ නැහැ. මවු භාෂාව කියන්නෙ තමන්ගෙ ආත්මේ වගේ, තමන්ගේ සිරිත් විරිත් තමන්ගේ ආගම තමන් කවුද කියන එක මේ ඔක්කොම දේවල් එක්ක බැඳෙන දෙයක්. ඒ නිසා කාගෙහරි මවු භාෂාව අනුමත කරන්නෙ නැත්නම් තමන්ගෙ මවු භාෂාවට තැනක් දෙන්නේ නැත්නම් මගේ හර්කය එක භාෂා අයිතීන්ට කරන උල්ලංඝනය කිරීමක්.

කැලණිය විශ්වවිද්‍යාලයේ වාග්විද්‍යා අධ්‍යයන අංශයේ ආචාර්ය කවිතා රාජරත්නම් මවු භාෂාව වෙනුවෙන් සිය හඬ අවදි කළේ මේ ලෙසය.

ලෝක භාෂා දිනය සැප්තැම්බර් 26 දින සමරනවා. නමුත් ජාත්‍යන්තර මවු භාෂා දිනය සැමරීම පෙබරවාරි 21 දිනට යෙදෙනවා. එය ආරම්භ කළබව 1999 පෙබරවාරි 21 දින දැනුම්දෙන ලද්දේ UNESCO ආයතනය විසින්. මෙම දිනයේ අරමුණ රටක පවතින පැරණිම භාෂා ආරක්ෂා කිරීම. භාෂාව පෝෂණය කිරීමට අනිවාර්යයෙන් පැරණි සාහිත්‍ය හා සම්ප්‍රදාය අවශ්‍යය වෙනවා.

එසේත් නොමැතිව කථන භාෂාවෙන් පමණක්ම මවු භාෂාව පෝෂණය අපහසුයි

මේ දෙයට මම යෝජනා කරන විසඳුම වන්නේ මවු භාෂාව හා දෙවන භාෂාව සෑම දරුවෙකුටම හොඳින් ඉගෙන ගන්න ඕනි. මක්නිසාද යත් මවු භාෂාව ඉතා නිවැරදිව අවබෝධ කර ගත් විට අනෙක් භාෂාවල අන්තිවාරමද පැහැදිලිව අවබෝධ වෙනවා.

ඉහත කරුණු සමඟ මඳක් සිතා බලන විට ඔබ සිතන්න මවුභාෂාවට හිමිවන තැන සහ මවුභාෂාව අද තිබෙන තැන. ජාතිය සිංහල යැයි ආඩම්බරයෙන් කියනවා සේම භාෂාව සිංහල යැයිද ඔබ ආඩම්බරයෙන් කිවයුතුය. ඉතින් ඔබ ඔබගේ සිතින් මඳක් අසන්න; ඔබ ඔබේ භාෂාවට දී තිබෙන තැන.

III කොටස



රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

මූල්‍ය ප්‍රකාශන

2021

ජනජයසිටි ගොඩනැගිල්ල, 09 වන මහල, නාවල පාර, රාජගිරිය.

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

2021 දෙසැම්බර් මස 31 දිනට මූල්‍යතත්ත්ව ප්‍රකාශනය

වත්කම්	සටහන	2021	2020
භාණ්ඩ ලේඛන	1	292,900.00	292,900.00
පෙර ගෙවීම්	2	22,698.00	-
සේවකයින්ට ලබාදෙන ණය	3	4,018,826.94	3,350,470,48
ඉන්වෙන්ට්‍රි අයිතම		103,500.00	-
ලිපි ද්‍රව්‍ය (තොග)		474,019,74	818,090.90
උප අග්‍රිම පියවීම		-	193,530.75
මුදල් සහ මුදල් සමාන		5,877,971.80	1,805,438.02
විශේෂ අත්තිකාරම්		2,000.00	2,000.00
උත්සව අත්තිකාරම්		7,400.00	7,400.00
අනිකුත් වත්කම්		14,950.00	-
		10,814,266.48	6,469,830.15
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත සහ උපකරණ	4	7,987,641.77	5,415,802.01
මුළු වත්කම්		18,801,908.25	11,885,632.16
බැරකම්			
ජංගම බැරකම්			
ගෙවිය යුතු	5	4,145,642.32	305,561.84
විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන		136,014.00	313,214.00
ජංගම නොවන බැරකම්			
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	6	3,952,612.77	3,562,360.27
මුළු බැරකම්		8,234,269.09	
ශුද්ධ වත්කම්		10,567,639.16	7,704,496.05
ශුද්ධ වත්කම්/සම කොටස්			
සමුච්චිත අතිරික්තය/හිඟය	7	10,567,639.16	7,704,496.05

මෙයට අමුණා ඇති සටහන මෙම මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩ කොටසක් සාදයි. වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් දක්වා ඇත්තේ අඩුකිරීම් ය.

මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිති සහ රජයේ මූල්‍ය රෙගුලාසි චක්‍රලේඛවලට අනුකූලව පිළියෙල කොට ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම වෙනුවෙන් කොමිෂන් සභාව වගකියනු ලැබේ. කොමිෂන් සභාව සඳහා සහ ඒ වෙනුවෙන් අත්සන් කරන ලදී.

....

(සභාපති) (කොමිෂන් සභා සාමාජික) ආර්.යූ. හෙට්ටිතන්ත්‍රිගේ
(ගණකාධිකාරි - වැඩබලන)

රාජ්‍ය භාෂා කොමිෂන්සභාව
2021 දෙසැම්බර් 31 වෙනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍යකාර්යසාධන ප්‍රකාශනය

	සටහන	2021	2020
ආදයම්			
භාණ්ඩාගාරයෙන්ලැබුනු පුනරාවර්තන ප්‍රදානයන්		28,122,000.00	21,718,000.00
ආදායම්		1,100.00	112,553.99
වෙනත් ආදායම්	8	167,615.61	111,390.77
මුළු ආදායම්		28,290,715.61	21,941,944.76
වියදම්			
වැටුප්, වේතනසහ සේවක ප්‍රතිලාභ	9	16,000,549.20	15,616,236.27
සැපයුම් සහපරිභෝජ්‍ය පාවිච්චි කිරීම්	10	1,949,732.52	1,838,679.25
ක්ෂය කිරීම්		1,470,158.63	3,002,980.64
අළුත්වැඩියා සහනඩත්තු කිරීම්	11	1,113,061.47	566,452.47
උපයෝග සහ අනිකුත්සේවාවන්	12	5,231,318.44	1,159,128.69
අනිකුත් වියදම්	13	593,940.39	133,800.00
රාජ්‍ය භාෂාප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන්	14	1,129,431.10	1,210,064.88
විගණන ගාස්තු		250,000.00	250,000.00
මුළු වියදම්		27,738,191.75	23,777,342.20
කාලපරිඡේදය සඳහාඅතිරික්තය/(හිඟය)		552,523.86	(1,835,397.44)

මූල්‍ය ප්‍රකාශනවලට අමුණා ඇති සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩ කොටසක් සාදයි.වරහන් තුළ ඇතිසංඛ්‍යාවලින් දක්වා ඇත්තේඅඩුකිරීම් ය.

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/හිමිකම්වල වෙනස්වීමේ ප්‍රකාශය

	භාණ්ඩාගාරයන් ලැබුනු ප්‍රතිපාදන	උපචිත අරමුදල්	වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය)	වෙනත්	එකතුව
2020.01.01 දිනට ආරම්භක ශේෂය		9,539,893.49			9,539,893.49
භාණ්ඩාගාරයෙන් ලැබුනු ප්‍රාග්ධන ප්‍රදානයන්			(1,538,397.44)		(1,538,397.44)
2020 වර්ෂය සඳහා අතිරික්තය/ (හිඟය)					
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය		9,539,893.49	(1,538,397.44)		**7,704,496.05**
2021 ජනවාරි 01 දිනට ශේෂය		**7,704,496.05**			**7,704,496.05**
භාණ්ඩාගාරයෙන් ලැබුනු ප්‍රාග්ධන ප්‍රදානයන්	1,745,000.00				1,745,000.00
පරිගණක ප්‍රත්‍යාගණනය කිරීම්				454,900.00	454,900.00
කාර්යාලීය ගෘහ උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම්				181,250.00	181,250.00
පිරියත සහ යන්ත්‍ර ප්‍රත්‍යාගණනය කිරීම්				108,500.00	108,500.00
2021 වර්ෂය සඳහා අතිරික්තය/ (ඌනතාවය)			552,523.86		552,523.86
නොපියවන ලද උපඅග්‍රිම නිවැරදි කිරීම				**(179,030.75)**	**(179,030.75)**
2020 දසැම්බර් 31 දිනට ශ්ෂය	1,745,000.00	**7,704,496.05**	552,523.86	**565,619.25**	**10,567,639.16**

මූල්‍ය ප්‍රකාශනවලට අමුණා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අවිණ්ඩ කොටසක් සාදයි. වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් දක්වා ඇත්තේ අඩුකිරීම් ය.

රාජ්‍යභාෂා කොමිෂන් සභාව
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ගැලීම් ප්‍රකාශය

	2021 රු.	2020 රු.
මෙහෙයුම්ක්‍රියාකාරකම්වලින් මුදල් ගැලීම		
අතිරික්තය/(හිඟය)	552,523.86	(1,835,397.44)
ජංගම නොවන සංචලන		
වාහන අපහරණය කිරීමෙන් ලද ලාභය	-	-
පාරිතෝෂික	390,252.50	439,615.37
ක්ෂය කිරීම්	1,470,158.63	3,002,980.64
පෙර වර්ෂයේ ගැලපීම්		
ආපදා ණය ශේෂය ගැලපීම	-	-
ජංගම නොවන සංචලනවලටපසුව මුදල් ගැලීම	2,412,934.99	1,607,198.57
කාරක ප්‍රාග්ධනවෙනස්වීම්		
පෙර ගෙවීම්වල (වැඩිවීම)/අඩුවීම	(22,698.00)	-
භාණ්ඩ ලේඛනවල (වැඩිවීම)/අඩුවීම	-	94,500.00
සේවකයින්ට ලබාදනලද ණයවල (වැඩිවීම)/අඩුවීම	(668,35646)	34,105.67
ඉන්වෙන්ට්‍රිඅයිතමවල (වැඩිවීම)/අඩුවීම	(103,500.00)	79,674.35
ලිපිද්‍රව්‍යවල (තොග) (වැඩිවීම)/අඩුවීම	344,071.16	153,288.31
අනිකුත් වත්කම්වල (වැඩිවීම)/අඩුවීම	(14,950.00)	614,800.00
උපඅග්‍රිමවල (වැඩිවීම)/අඩුවීම	-	-
විශේෂ අත්තිකාරම්වල (වැඩිවීම)/අඩුවීම	-	3,200.00
නොපියවන ලදඅත්තිකාරම්වල (වැඩිවීම)/අඩුවීම	-	-
උත්සව අත්තිකාරම්වල (වැඩිවීම)/අඩුවීම	-	10,000.00
ගෙවිය යුතු - (වැඩිවීම)/අඩුවීම	3,804,080.48	(1,325,427.01)
උපඅග්‍රිම පියවීම්වලවැඩිවීම්/(අඩුවීම)	14,500.00	(14,500.00)
ගෙවිය යුතු විගණනගාස්තුවල (වැඩිවීම)/අඩුවීම	(177,200.00)	4,360.00
	3,211,947.18	(345,998.68)
මෙහෙයුම්ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගැලීම	5,624,882.17	1,261,199.89
ආයෝජනක්‍රියාකාරකම්වලින් මුදල් ගැලීම		
දේපළ යන්ත්‍ර සහ පිරියතම්ළදී ගැනීම්	(3,297,348.39)	(126,750.00)
මෝටර් රථ අපහරණයකිරීම	-	-
ආයෝජනක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගැලීම	(3,297,348.39)	(126,750.00)
මූල්‍යක්‍රියාකාරකම්වලින් මුදල් ගැලීම		
භාණ්ඩාගාරයෙන් ලැබුනු ප්‍රාග්ධනප්‍රදානයන්	1,745,000.00	-
මූල්‍යක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගැලීම	1,745,000.00	-
මුදල් සහ සමානඅගයන්හි ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්)	4,072,533.78	1,134,449.89
වර්ෂය ආරම්භයේදීමුදල් සහ සමාන අගයන්	1,805,438.02	670,988.13
වර්ෂය අවසානයේදීමුදල් සහ සමාන අගයන්	5,877,971.80	1,805,438.02

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව
2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම් ප්‍රතිපත්ති

1. වාර්තා කරන ආයතනය

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව **1991** අංක **18** දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනත මගින් සංස්ථාපනය කරන ලද පූර්ණ ලෙස රජයට අයත් ව්‍යවස්ථාපිත මණ්ඩල ආයතනයක් වන අතර, එය රාජ්‍ය සේවා, පළාත සභා හා පළාත් පාලන අමාත්‍යාංශ විෂයපථයට අයත් වේ. කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්යාලය "ජනජය සිටි" ගොඩනැගිල්ල, **09** වෙනි මහල, නාවල පාර, රාජගිරිය අංක **40**, බුත්ගමුව පාර, රාජගිරිය යන ස්ථානයේ පිහිටා ඇත.

1.1 ප්‍රතිපත්තිමය ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

කොමිෂන් සභාවේ ප්‍රතිපත්තිමය ක්‍රියාකාරකම වන්නේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමයි.

1.2 සේවක සංඛ්‍යාව

2020 දෙසැම්බර් **31** දිනට කොමිෂන් සභාවේ සේවක සංඛ්‍යාව **20** ක්වූ අතර, **2020** වර්ෂය සඳහා අනුමත සේවක සංඛ්‍යාව **42** කි.

1.3 මූල්‍ය ප්‍රකාශනවල වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම වෙනුවන් අධ්‍යක්ෂක මණ්ඩලය වගකියනු ලැබේ.

2 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලවීමේ ප්‍රකාශනය

මෙම මූල්‍ය ප්‍රකාශන මූල්‍ය කාර්යසාධනයේ ප්‍රකාශනය, මුදල් ගැලීමේ ප්‍රකාශනය, සමකොටස්වල **(Equity)**වෙනස්වීමේ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් යන කරුණුවලින් සමන්විත වේ. මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනය, මුදල් සහ ක්‍රම සම්පාදන අමත්‍යාංශය සහ විගණකාධිපති දෙපාර්මේන්තුව එක්ව නියම කොට ඇති පරිදි සහ මුදල් රගුලාසි සහ අදාළ රජයේ චක්‍රලේඛවල දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූලව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව පිළියෙල කොට ඇත.

2.2 ඇගයීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන; **1983** අංක **12** දරන පාරිතෝෂික පනත පාදක කරගත් සේවක විශ්‍රාම පාරිතෝෂික හැර ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කොට ඇත. මූල්‍ය ප්‍රකාශනවල උද්ධමනීය සාධක සඳහා ගැලපීම් කොට නැත.

2.3 ඉදිරිපත් කරනු ලබන මුදල් වර්ගය

මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කරනු ලබන්නේ ශ්‍රී ලංකා රුපියල් වලිනි.

ඇස්තමේන්තුවල සැලකිය යුතු ප්‍රමාණයක තොරතුරු සහ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනෙන ගණන් මත අවිනිශ්චිත ලෙස වඩාත් සැලකිය යුතු බලපෑම් වන්නේ පහත කරුණු ය.

සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන **(**සටහන **9)**
වත්කම් අපහායනය කිරීම **(**සටහන **3.1)**

2.4 ද්‍රව්‍යාත්මක බව සහ ඒකරාශි කිරීම

එක් එක් වර්ගවලට අයත් සමරූපී අයිතමයන් වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත. අසමරූපී වර්ගවල හෝ කාර්යයන්හි අයිතමයන් අද්‍රව්‍ය මීසක වෙන්කර ගෙනහැර දක්වා ඇත.

2.5 සංසන්දනාත්මක තොරතුරු

පවත්නා වර්ෂයේ ඉදිරිපත් කිරීමට සෑම අවස්ථාවකදීම අනුකූලතාවයක් දක්වන පරිදි සංසන්දනාත්මක තොරතුරු වර්ගීකරණය ඇත.

3 සුවිශේෂී ගිණුම් පිළිවෙත්

පසුගිය වර්ෂයේ භාවිතා කරන ලද ගිණුම් පිළවෙත් වෙනස් නොවන අතර, ඒවා ස්ථීරවම ආයතනය විසින් අදාළ කරගෙන ඇත.

3.1 වත්කම් සහ ඒවා තක්සේරු කිරීමේ පදනම
දේපළ, පිරියත සහ උපකරණ

හඳුනාගැනීම සහ මිනුම් කිරීම
